# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2055/1 - 2018 ජනවාරි මස 22 වැනි සඳුද - 2018.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වැලිවිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක ගා 3734 හි සවිස්තරව පෙන්නුම් කරන කැබලි අංක 01 සහ 02 දරන ඉඩම් කැබලි.

1. **කැබලි අංක 01**
ඉඩමේ නම: පොල්ගහවිල ගෘප් තුත්තුඩුව; ඉඩමේ විස්තරය: ගෙවතු ස්ථිර ගොඩනැගිලි 42 ක් ඇත; ප්‍රමාණය: හෙක්: 1.9609.

2. **කැබලි අංක 02**
ඉඩමේ නම: කොහිලදෙණිය කුඹුර; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්: 0.0912.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 පෙබරවාරි මස 08 වැනි දින පෙ.ව. 10.00 ට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 පෙබරවාරි මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. තම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා පරීක්ෂණ දිනයේදී හිමිකම් ඔප්පු ඉදිරිපත් කළ යුතුය.

ඒ. එම්. ඒ. යූ. ජී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්
වැලිවිටිය දිවිතුර.

2018 ජනවාරි මස 12 වැනි දින,

02 - 213


1A - G 26971 - 17 (2018/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.